# ශ්‍රී කීසීන්



යුරේෂි සඟිණි බිමක්ෂා රාජපක්ෂ

# ශුක්සත්

එච්.පී.යුරේෂි සශිණි බිමක්ෂා රාජපක්ෂ

**යුකීසන්**

කතෘ ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2026 මැයි

කතාව සහ චිත්‍ර
**එච්.ජී. යුරේෂි සගිණි බිමක්ෂා රාජපක්ෂ**
9 ශ්‍රේණිය D
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

කතෘගේ වෙනත් කෘතීන්

01. අහින්සක ලේන් පැටියා - 2019
02. සුදු පූසි - 2020
03. හිරු කුමරු යන්න ගිහින් - 2020
04. අභ්‍යවකාශ චාරිකාව - 2023
05. පුංචි නොරිකො - 2024
06. වර්ෂ 5025 - 2025

ISBN 978 624 211 268 - 8

# පිදුම

අසීමිත බාධා හමුවේ
සිහින අත් නොහැර
ජීවන සිහින සැබෑ කර ගන්න උර දුන්
මාගේ මහාමායා විදු මෑණියන්හට
මාගේ මේ කෘතිය
ගෞරවයෙන්
සෙනෙහසින්
පුද කරමි.

“දිගුකල් දිනේවා මහාමායා මාතා”



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# ආණ්ඩුකාරතුමාගේ සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# දියවඩන නිලමෙ තුමාගේ සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව,<br>
2026.05.10

හිම වැටෙන හරිම සීතල දවසක යොෂි කියන දුප්පත් දර ලී කපන්නාට දරුණු උගුලකට අහුවෙලා හිටපු ලස්සන කොකෙක්ව හමුවුණා.....

ඉතින් යොෂිට මේ ලස්සන කොකා ගැන දුක හිතිලා බොහෝම අමාරුවෙන් මේ කොකාව උගුලෙන් නිදහස් කර හැරියා.



සති දෙකක් පමණ ගත වුණා, එදා දවසත් හරිම සීතල හිම කුණාටු වැටුන දවසක්.

ඉතින් මේ කුණාටු අතරේ යුකී
කියන ඉතාමත්
රූමත් තරුණිය
නවාතැනක් සොයා
යොෂිගේ දුප්පත්
පැල්පත ලඟට
පැමිණියා.



යොෂීට දුක හිතුනා.

සිතලට ගැහෙමින් හිටිය මේ රූමත්

තරුණියට තමන්ගේ පැල්පතේ නවාතැන් දුන්නා.

ටික දිනක් ගත වෙද්දී මේ දෙන්නා

ආදයෙන් බැඳිලා විවාහ වුණා.

ඔහෝම කාලයක් ගෙවිලා ගියා...



දවසක් යුකී යොෂිට කියුවා තමන් රෙදි වියන්නම් කියලා.

ඉතින් යුකී එහෙම කියලා යොෂි ගෙන් පොරොන්දුවක් ගත්තා....

ඒ... කවදාවත් රෙදි වියන කාමරයට එබිලා බලන්න එපා කියලා.



ඉතින් යොෂී කාමරයට ගිහින් රෙදි වියන්න පටන් ගත්තා.

ටික වේලාවකින් යුකි කාමරයෙන් එලියට ඇවිත්

තමන් වියපු රෙදි සියල්ල යොෂීට පෙන්නුවා.

යුකී වියලා තියෙන්නේ ඉතාමත් ලස්සන, සිනිදු ලස්සන රෙදි වගයක්.

යොෂී මේ රෙදි දැකලා පුදුම වුනා.



ටික කාලයක් ගත වුණා.

යොෂීට මේ ගැන කුතුහලයක් ඇති වුණා.

ඉතින් යොෂී යුකීට දුන්න පොරොන්දුව අමතක කරලා රෙදි වියන කාමරය ඇතුලත බැලුවා.

රෙදි වියන කාමරය ඇතුලත හිටියෙ යුකී නෙවෙයි.



තමන්ගෙම තටු ගලවලා බොහොම අමාරුවෙන් රෙදි වියන කොකෙක්. යොෂී මෙය දැක පුදුම වුණා. ඔහු මෙච්චර දවසක් හිතාන හිටපු තරුණිය එදා ඔහු බේරාගත්ත ඒ ලස්සන කොකයි.

යොෂී යුකීට දුන්න පොරොන්දුව කඩ කරපු නිසා කොකාට ආපසු යන්න සිදු වුණා...

නමුත් යුකී යන්න කලින් යොෂීට මෙහෙම කිව්වා.

යොෂී ඔබ මට දුන්න පොරොන්දුව කඩ කලා. ඔබට නැවත මාව දකින්නට නොලැබේවි. මා දැන් යන්නේ රටවල් 39ට එහා 40 වැනි රටේ සිටින නපුරු කේසයි රාක්ෂයා ලඟට. ඔබට මා ඕනෑ නම් ඔබ මා සොයා පැමිනෙන්න.



ඉතින් යොෂි ඔහු දුන්න පොරොන්දුව කඩ කිරීම ගැන දුක්වුණා... කාලයක් ගත වුණා...

යොෂීට යුකීව අමතක කරන්නම බැරි වුණා. ඉතින් යොෂී යුකීව හොයාගෙන යන්න පිටත් වුණා.

අවුරුද්දක් ගත වුණා. අවුරුදු දෙකක් ගත වුණා. අන්තිමේදී යොෂී නපුරු කේසයි රාක්ෂයාගේ මාළිගාවට ආවා.



ඔහු කේසයි රාක්ෂයත් සමග බොහොම දරුණු සටනක් කරා. යොෂී බොහොම තුවාල වුණා.

අවසානයේ දී යොෂීට පුලුවන් වුණා කේසයි රාක්ෂයව පරද්දන්න.

ඉතින් යොෂී යුකීත් සමග තම ගම රට බලා යන්න ගියා.

ඉන්පසු ඔවුන් සතුටින් ආදරෙන් ජීවත් වුණා.

• • • •



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්